**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව - 2017**

**------------------------------------------------------------------------**

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකිම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනිම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථානෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර/ශ්‍රීලංමූවාප්‍ර) අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශ්‍රීලංගිප්‍ර 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

සංස්ථාවේ සම්පූර්ණ අයිතිය හිමි පරිපාලිත සමාගමක් ලෙස සංස්ථාව විසින් දෙව්කොෂෝවා (පුද්ගලික) සමාගමේ රු.9,210,740 ක ආයෝජනයක් කර තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. තවද, මෙම පරිපාලිත සමාගමෙන් සංස්ථාවට ලැබිය යුතු රු.34,802,842 ක ණයගැති ශේෂයක් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. එසේ වුවත්, මෙම ශේෂය තහවුරු කිරීම සඳහා විගණනය වෙත ඉදිරිපත් කිරීමට ලේඛනගත සාක්ෂි කිසිවක් නොතිබුණි.

(ආ) **ශ්‍රීලංගිප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

ප්‍රමිතියේ විධිවිධානයන්ට පටහැනිව, සවලීකරණ අත්තිකාරම් තුළ ඇතුලත් රු.5,801,279 ක හර ශේෂයක් හා ණයගැතියන් තුළ ඇතුලත් රු.50,990,962 ක බැර ශේෂයක් 2017 දෙසැම්බර් 31 දිනට පැවති බැර හා හර ශේෂයන්ට එරෙහිව හිලව් කර තිබුණි.

(ඇ) **ශ්‍රීලංගිප්‍ර 16 - දේපළ, පිරියත හා උපකරණ**

ප්‍රමිතියේ දක්වා ඇති පරිදි ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමට අසමත් වීම නිසා සම්පූර්ණ අගයම ක්ෂය කරනු ලැබූ පිරිවැය රු.2,318,571 ක්, රු.3,558,000 ක් හා රු.43,623,436 ක් වූ කාර්යාල උපකරණ අයිතම 42 ක්, මෝටර් රථ 07 ක් හා යන්ත්‍රසූත්‍ර අයිතම 54 ක් අඛණ්ඩව භාවිතයට ගෙන තිබුණි. එසේම, ඇස්තමේන්තුගත වරද සංශෝධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද සම්පූර්ණ අගයම ක්ෂය කරන ලද යන්ත්‍ර සූත්‍ර අයිතම 93 ක හා මෝටර් රථයක පිරිවැය විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) **ශ්‍රීලංගිප්‍ර 39 - මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මැනීම**

**--------------------------------------------------------------------**

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය අතුරින් එකතුව රු.188,544,980 ක ශේෂයක් හානිකරණය සඳහා සැලකිල්ලට ගෙන නොතිබුණි. එම නිසා මෙම ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ අගයකට පිළිඹිබු නොවේ.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------------**

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කෙරේ.

(අ) 2015 වර්ෂය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලද තක්සේරු වාර්තාවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකතුකළ අගය මත බදු (වැට්) මත අධිභාරය ලෙස එකතුව රු.115,003,889 මුදලක් ගෙවීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් කිසිඳු ප්‍රතිපාදනයන් සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්හී දැක්වෙන උපචිත වියදම් තුළ එකතුව රු.23,598,467 ක හර ශේෂයක් ඇතුලත් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස උපචිත වියදම් එම ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සේවාදායකයින්ගෙන් අයවිය යුතු මුදල් ගෙවා නිදහස් කර තිබුණත්, ඒ සඳහා සහතික කළ බිල්පත් නොමැතිවීම නිසා ණයගැති ශේෂය තුළ රු.6,533,077 ක අසාමාන්‍ය බැර ශේෂයක් නිරීක්ෂණය විය.

(ඈ) දෝෂ සහිත ගණනය කිරීම් හේතුවෙන් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු හා අධිභාර ගෙවීම් රු.37,635,363 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, 2014/2015 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු මත දඩමුදල රු.2,182,836 ක් ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.3 නොසැසඳු වෙනස්කම්**

**----------------------------**

පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

(i) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ දක්වා ඇති ශේෂය සහ ගෙවිය යුතු එකතු කළ අගය මත බදු උපලේඛනය අතර රු.825,850 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) 2016 ජූලි 25 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සැකසූ තක්සේරු වාර්තාව අනුව එකතු කළ අගය මත බදු දඩ මුදල රු.115,003,889 ක් විය. කෙසේ වුවත්, විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව රු.28,849,344 ක් ලෙස දක්වා තිබුණි.එබැවින්, මෙම සංඛ්‍යා දෙක අතර රු.86,154,545 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) විගණනය වෙත ඉදිරිපත් කරන ලද විවිධ අත්තිකාරම්, ටෙන්ඩර් තැන්පතු, වෙනත් තැන්පතු, ලංකා විදුලිබල මණ්ඩලයේ තැන්පතු හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැතියන් සඳහා වෙන් කිරීම් සහ අනුලේඛනවල දැක්වෙන අනුරූපිත ශේෂයන් අතර රු.5,182,912 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් අයිතමයට අදාලව දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් අයිතමය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | රඳවා ගැනීම් බදු | 135,044,649 | රඳවා ගැනීම් බදු සහතිකවල පිටපත් |
| (ආ) | එකතු කළ අගය මත බදු ශේෂයන් | 561,047,472 | උපලේඛන හා කාල විශ්ලේෂණය |
| (ඇ) | ජාතිය ගොඩනැගීමේ බදු ආරම්භක ශේෂය | 5,335,464 | උපලේඛන හා කාල විශ්ලේෂණය |
| | **එකතුව** | **701,427,585** | |

### 2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සේවාදායකයින්ගෙන් ලැබිය යුතු රු.352,833,031 ක වෙළඳ ණයගැති ශේෂයෙන් වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා සහ වර්ෂ 05 ඉක්මවූ පිළිවෙලින් රු.25,212,161 ක් හා රු.27,938,734 ක් හිඟව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) මිලදී ගැනීම් අත්තිකාරම්, ඉදිකිරීම් අත්තිකාරම් සහ විවිධ අත්තිකාරම් රු.70,717,854 ක ශේෂයන් අතුරින්, රු.11,675,971 ක මුදලක් පියවා නොමැතිව වර්ෂ පහකට වඩා වැඩි කාලයක් හිඟ හිටව පැවතුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ හතර හා වර්ෂ හයක කාලයක් ඉක්මවූ සේවාදායකයින්ගෙන් ලද සවලීකරන අත්තිකාරම් පිළිවෙලින් රු.19,191,990 ක් හා රු.9,447,187 ක් හිඟ හිටව පැවතුනි.

(ඈ) මූලා ප්‍රකාශනයන්හි දැක්වෙන රු.503,047,861 ක රඳවා ගැනීමේ මුදල් අතරින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති 38 ට අදාලව රු.100,916,486 ක මුදලක් වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුනි. තවද, ව්‍යාපෘති 40 ට අදාලව රු.39,347,662 ක රඳවා ගැනීම් මුදලක් වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුනි. ව්‍යාපෘති අටක් අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කර තිබුණද එකතුව රු.21,408,189 ක රඳවා ගැනීම් මුදල් ශේෂයක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොගෙන හිඟව පැවතුනි.

(ඉ) එකතුව රු.157,934,872 ක සේවාදායකයින්ගෙන් අයවිය යුතු ප්‍රමාද කළ අලාභ අතුරින් වර්ෂ හතරකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.107,304,615 ක මුදලක් හිඟව පැවතුනු අතර 2017 දෙසැම්බර් 31 දින වන විටත් එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) වටිනාකම රු.310,744,601 ක උපචිත වියදම් නිරවුල් කිරීමකින් තොරව වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට හිඟහිටව පැවතුනි. එබැවින්, මෙම වියදම්වල නිවැරදිතාවය සහ විශ්වාසනීයත්වය විගණනයට සැකයක් විය.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.20,800,000 ක් සහ එම ණය සඳහා පොලිය රු.93,511,000 ක් විය. කෙසේ වුවත්, මෙම නොගෙවූ ශේෂයන් නිරවුල් කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) 2002 සිට 2017 දක්වා කාලයට අදාල එකතු කළ අගය මත බදු එකතුව රු.717,253,475 ක් සහ ඊට අදාල රු.28,849,344 ක දඩ මුදල් සහ රු.7,144,502 ක ජාතිය ගොඩනැගීමේ බදු හා ඊට අදාල රු.953,141 ක අධිභාර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනතේ 02 වන කොටස | ආර්ථික සේවා ගාස්තු රු.28,371,278 ක් හා ඊට අදාල අධිභාර රු.13,654,032 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 396 | මාස හය ඉක්මවා උපලබ්ධි නොවූ හා ඉදිරිපත් නොකර තිබූ උපලබ්ධි නොවූ චෙක්පත් 6 ක් හා ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම පිළිවෙලින් රු.1,725,909 ක් හා රු.1,533,131 සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | 2009 ජූලි 01 දිනැති අංක ඩීඑම්ජී/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයේ අවශ්‍ය තොරතුරු ඇතුලත් කර නොතිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිඝණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

# 03. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,206,658 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.22,841,652 ක් වුයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,634,994 ක දැඩි පිරිහීමක් දැක්වුණි. මෙම තත්ත්වය සඳහා බැංකු අයිරා මත පොලී වියදමේ වැඩිවීම,සේවක ප්‍රතිලාභ වියදම් හා හානිකරණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම වැඩිවීම් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.1.1 සංස්ථාවේ අගය එකතු කිරීම

සංස්ථාවේ අගය එකතු කිරීම 2015 වර්ෂයේ සිට ක්‍රමයෙන් අඩු වී තිබුණි. සේවක ප්‍රතිලාභ,බදු වියදම් හා ක්ෂය කිරීම් ගිණුම්ගත කිරීමෙන් පසු 2015 වර්ෂයේදී වාර්තා වූ රු.950,461,143 ක අගය එකතු කිරීම 2016 වර්ෂයේ රු.895,895,814 ක් සහ 2017 වර්ෂයේ රු.795,648,070 ක් දක්වා අඩු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සංස්ථාවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2017 (ප්‍රතිශතය) | 2016 (ප්‍රතිශතය) |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 7.37 | 12.78 |
| එකතු කළ ලාභ (අධිකය) | 1.08 | 1.08 |
| පිරිවැටුම මත පරිපාලන පිරිවැය | 8.39 | 9.48 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 5.05 | 4.58 |
| ජංගම අනුපාතය | 1.10 | 1.04 |
| ක්ෂණික අනුපාතය | 1.01 | 0.9 |

(i) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි දළ ලාභ ආන්තිකය සියයට 5.41 කින් පහල ගොස් තිබුණු අතර, ශුද්ධ ලාභ ආන්තිකය සියයට එකකින් පමණක් පහල ගොස් තිබුණි.

(ii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි පිරිවැටුම මත පරිපාලන පිරිවැය හා පිරිවැටුම මත මූල්‍ය පිරිවැය පිළිවෙලින් සියයට 1.14 ක් හා සියයට 23 කින් පහල ගොස් තිබුණි.

# 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම්කරණය

ශ්‍රී ලංකාවේ හෝ විදේශියව ඉංජිනේරු කර්තව්‍යන්ට අවශ්‍ය වන කොන්ක්‍රීට්, සවිගන්වන ලද කොන්ක්‍රීට් සහ පෙරසැරි කොන්ක්‍රීට් නිෂ්පාදන නිෂ්පාදනය කිරීම හා විකිණීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු වලින් එකක් විය. කෙසේ වුවත්, සංස්ථාවේ කාර්යසාධන වාර්තා සහ අයවැය ඇස්තමේන්තුවට අනුව සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල නිෂ්පාදන හා විකුණුම් සම්බන්ධයෙන් පහත දැක්වෙන ඉලක්කයන් අපේක්ෂා කළ පරිදි ඉටු කරගෙන නොතිබුණි.

**(i) 2017 වර්ෂයේ නිෂ්පාදනය**

| වැඩබිමේ නම | සැලසුම්ගත | සත්‍ය | ඉටුකර නොගත් |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| රත්මලාන | 153,486,720 | 135,584,764 | 17,901,956 |
| බෝපිටිය | 169,111,995 | 85,884,060 | 83,227,935 |
| වේරගන්තොට | 130,815,600 | 90,177,205 | 40,638,395 |
| මැදවච්චිය | සැලසුම්කර නොතිබුණි | 36,828,574 | - |
| **එකතුව** | **453,414,315** | **348,474,603** | **104,939,711** |

**(ii) 2017 වර්ෂයේ විකුණුම්**

| වැඩබිමේ නම | සැලසුම්ගත | සත්‍ය | ඉටුකර නොගත් |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| රත්මලාන | 200,000,000 | 136,581,369 | 63,418,631 |
| බෝපිටිය | 125,000,000 | 72,912,122 | 52,087,878 |
| වේරගන්තොට | 125,000,000 | 78,771,952 | 46,228,048 |
| මැදවච්චිය | 50,000,000 | 34,763,072 | 15,236,928 |
| **එකතුව** | **500,000,000** | **323,028,515** | **176,971,485** |

### 4.1.2 ඉදිකිරීම් කොන්ත්‍රාත්

විමර්ෂනය, ආයෝජනය, සැලසුම් කිරීම, නිර්මාණයන්, ඉදිකිරීම් මෙහෙයුම් හා ගොඩනැගිලි කළමනාකරණය, සිවිල් ඉංජිනේරු, වෙනත් ඉංජිනේරු ව්‍යාපෘති හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක වෙනත් ව්‍යාපාර අත්කර ගැනීම හෝ පවත්වා ගැනීම සංස්ථාවේ මූලික අරමුණ විය. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් ඉටු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

(අ) නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සංස්ථාවට භාර දී තිබූ අතර මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වල ස්ථාන 10 ක පැතිබෑම් ඉදිකිරීමට අපේක්ෂා කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ආරම්භක දිනය 2017 මාර්තු 24 දින වූ අතර 2019 මාර්තු 22 දින වන විට දින 728 ක් තුළ සම්පූර්ණ කළ යුතු විය. මෙම කාර්ය සංස්ථාව විසින් ඉතාලි සමාගමකට උපකොන්ත්‍රාත්තුවක් ලෙස ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් දුර්වලතා අනාවරනය විය.

(i) ව්‍යාපෘතියේ මුළු වටිනාකම රු. මිලියන 1,931 ක් වූ අතර 2018 අප්‍රේල් 30 දින වන විට නිම කරන ලද මුළු වැඩ වටිනාකම රු. මිලියන 140 ක් එනම් සියයට 6.8 ක ප්‍රතිශතයක් විය. එබැවින්, ඉදිරි මාස 11 ඇතුලත රු. මිලියන 1,791 ක වටිනාකමකින් යුක්ත ඉතිරි වැඩ කටයුතු සම්පූර්ණ කිරීමට ඇති හැකියාව විගණනයට සැක සහිත විය. කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම සඳහා එකඟ වූ කාලසීමාව තුළ වැඩ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා උපකොන්ත්‍රාත්කරුගේ ධාරිතාව ප්‍රමාණවත් නොවන බව ව්‍යාපෘති උපදේශක විසින්ද දැනුවත් කර තිබුණි.

(ii) ප්‍රතිග්‍රහණ ලිපියේ කොන්දේසිවලට අනුකූලව ව්‍යාපෘති වටිනාකමින් සියයට 10 ක කාර්යසාධන බැදුම්කරයක් සංස්ථාව උපකොන්ත්‍රාත්කරුගෙන් ලබාගෙන නොතිබුණි.

(iii) සංස්ථාව විසින් උපකොන්ත්‍රාත්කරු තෝරාගැනීමේදි උපකොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ශක්තිය සහ තාක්ෂණික ශක්තිය තක්සේරු කර නොතිබුණි. තවද, මෙම ව්‍යාපෘතියේ දුර්වල කාර්යසාධනය සඳහා ප්‍රමාණවත් නොවූ අධීක්ෂණය හා ව්‍යාපෘති කළමනාකරණය බලපා තිබුණි.

(ආ) ජාතික රෝහලේ හෘද රෝග ඒකකයේ ප්‍රතිසංස්කරණ කටයුතු 2015 දෙසැම්බර් 02 දින සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සංස්ථාව වෙත භාර දී තිබුණු අතර 2016 ජූලි 10 වන දින විට නිමකලයුතු විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අලුත්වැඩියා කටයුතු 2018 අප්‍රේල් 09 වන දින දක්වා නිම කර නොතිබුණි. අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් රෝහල බරපතල ගැටළුවකට මුහුණපා තිබුණු බව ජාතික රෝහලේ අධ්‍යක්ෂකවරයා විසින් සංස්ථාවට දන්වා තිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුලත් වීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඇ) මුළු වටිනාකම රු.65,124,932 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් ව්‍යාපෘති 6 ක කාර්යසාධනය නොමැති වීම නිසා අතහැර දමා තිබූ අතර ඒ සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවුනි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රත්මලාන හා මැදවච්චිය කොන්ක්‍රීට් අංගන සමාලෝචිත වර්ෂය තුල පිළිවෙලින් රු. මිලියන 23.6 ක් හා රු. මිලියන 2.1 ක ශුද්ධ පාඩුවක් ලබා තිබුණු අතර එම අංගනවල ඉකුත් වර්ෂයේ පිළිවෙලින් රු. මිලියන 20 ක හා රු. මිලියන 3.2 ක ලාභයක් වාර්තා කර තිබුණි.

(ආ) ඇණවුම් ලද වර්ෂය තුල අදාල ඇනවුම් සඳහා භාණ්ඩ සැපයිය යුතුය. එසේ වුවත්, වටිනාකම රු.71,598,000 ක කොන්ක්‍රීට් නිෂ්පාදන සැපයීම සඳහා වූ ඇනවුම් ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය තුල හා ඉකුත් වර්ෂයේ විගණන දිනය වූ 2018 ජූලි 30 වන විටත් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අම්තිරිගල ඇස්පලට් වැඩබිමේ පිරිවැටුම සහ දළ අලාභය පිළිවෙලින් රු. මිලියන 47.56 ක් හා රු. මිලියන 6.7 ක් විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සංසන්දනය කිරීමේදී එය සියයට 2969 ක අඩුවීමක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පොලොන්නරුව ඇස්පලට් වැඩබිමෙහි දළ අලාභය රු.10,200,719 ක් වූ අතර ඊට හේතුව සමාලෝචිත වර්ෂය තුල මෙම වැඩබිම විසින් මෙහෙයුම් කටයුතු පවත්වා නොතිබීම විය. මේ අතර සමාලෝචිත වර්ෂයේ බෝපිටිය ක්‍රෂර් වැඩබිමෙහි දළ අලාභය රු.6,937,591 ක් වාර්තා විය.

## 4.3 මූල්‍ය කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විධිමත් ණය අයකර ගැනීමේ යාන්ත්‍රණයක් හා කාරක ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාව විසින් ලබාගත් මුළු බැංකු අයිරා පහසුකම රු. මිලියන 908 ක් විය. කෙසේ වුවත්, 2013 ජූලි 01 දිනැති අංක පීඊඩී/සීඔපී/15(56)ජීඊඑන්/වීඔඑල්-01 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපිය අනුව අනුමත අයිරා පහසුකම රු. මිලියන 580 ක් විය. තවද, මෙම බැංකු අයිරා පහසුකම පසුගිය වර්ෂය තුල සම්පූර්ණයෙන්ම යොදාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කර නොතිබුණි. ඒ කෙසේ වුවත්, සමාලෝචිත වර්ෂය තුල මෙම බැංකු අයිරා සඳහා රු. මිලියන 111.6 ක පොලියක් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.908,175,280 ක බැංකු අයිරාවක් තිබියදීත්, සංස්ථාව විසින් ස්ථාවර තැන්පතු හා ඉතිරිකිරීමේ තැන්පතු පිළිවෙලින් රු.67,526,650 ක් හා රු.116,028,219 ක් පවත්වාගෙන ගොස් තිබුණි.

## 4.4 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවේ බද්ධ ව්‍යාපාර ආයතනයක් වු ෆූජිමා ස්ටේට් කෝපරේෂන් (පීවීටී) ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 මාර්තු 31 දිනට සංස්ථාවට ලැබිය යුතු මුදල රු.41,899,490 ක් වූ අතර ඉන්පසු කිසිඳු ගනුදෙනුවක් සිදු වී නොතිබුණි. කෙසේ වුවත්, සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් අයවීම් පියවා ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සංසන්දනය කිරීමේදි සමාලෝචිත වර්ෂය තුල අතිකාල දීමනා ගෙවීම් වියදම රු. මිලියන 25 කින් එනම් සියයට 41 කින් ඉහල ගොස් තිබුණි.

(ඇ) සමහර අවස්ථාවලදි අතිරේක වැඩ කටයුතු සඳහා සහ විචලනයන් සඳහා සංස්ථාව විසින් සේවාදායකයින්ගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම වැඩ කටයුතු සඳහා ගෙවීම් පැහැර හරින විට සේවාදායකයින්ට එරෙහිව සංස්ථාවට ක්‍රියාමාර්ග ගැනිමට නොහැකි වී තිබුණි.

## 4.5 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 වර්ෂයේදි බෝපිටිය කොන්ක්‍රීට් අංගනයේ සිදු වු රු.633,414 ක මුදල් වංචාවෙන් රු.268,000 ක් අය කරගෙන තිබුණු අතර අදාල පාර්ශව වලින් ඉතිරි ශේෂය අය කරගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) 2017 වර්ෂය සඳහා සංස්ථාවට අමතර කොටස් මිලදී ගැනීම සඳහා යාන්ත්‍රික අංශයෙහි නිලධාරියකුට රු.739,000 ක චෙක්පතක් සංස්ථාව ලබා දී තිබුණි. ඉන් පසුව, එම අමතර කොටස් මිලදී නොගෙන මෙම චෙක්පත අක්‍රමවත්ව ඔහු විසින් මුදල් බවට පත් කරගෙන තිබුණි. කෙසේ වුවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 5.3 වන වගන්තිය අනුව මෙම නිලධාරියාට එරෙහිව සංස්ථාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.6 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ඇස්පලට් යන්ත්‍ර අතරින් රු. මිලියන 101 ක් වටිනා ඇස්පලට් යන්ත්‍රයක් පොලොන්නරුවේ ස්ථාපිත කර තිබූ අතර එම ඇස්පලට් යන්ත්‍රයෙහි දිනක නිෂ්පාදන ධාරිතාවය ඇස්පලට් මෙට්‍රික් ටොන් 600 ක් විය. කෙසේ වුවත්, 2014 වර්ෂයෙන් පසු එහි නිෂ්පාදනය අත්හිටුවීම හේතුවෙන් එම යන්ත්‍රය හා උපාංග අක්‍රියව පැවතුනි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් වේතන හා ආරක්ෂක වියදම් ලෙස රු.1,748,322 ක් දරා තිබුණි.

(ආ) සංස්ථාවේ රත්මලාන ප්‍රධාන ගබඩාව වාහන අමතර කොටස් කුඩා ප්‍රමාණයක් සඳහා පමණක් භාවිතා කර තිබුණි. ප්‍රධාන ගබඩාවේ විශාල ඉඩ ප්‍රමාණයක් නිෂ්කාර්යව පැවතුනි.

## 4.7 හඳුනාගත් පාඩු

ව්‍යාපෘති 11 ක කොන්ත්‍රාත් වටිනාකම ඉක්මවා කොන්ත්‍රාත් පිරිවැය දැරීම නිසා රු.115,210,487 ක අලාභයක් සංස්ථාවට සිදු වී තිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 489 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 654 ක් විය. ඒ අනුව සංස්ථාව විසින් විවිධ තනතුරු සඳහා සේවකයින් 165 ක් අතිරික්තව බඳවා ගෙන තිබුණි.

(ආ) ඉහල කළමනාකරණයේ නිලධාරීන් ඇතුලුව කොන්ත්‍රාත් පදනම මත වරින් වර සේවකයන් බඳවාගෙන තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුල ජ්‍යෙෂ්ඨ කළමනාකරණය නියෝජනය වන තනතුරු දෙකකට කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණි. මෙය සංස්ථාවේ කාර්යසාධනයට සෘජුවම බලපා තිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දින වන විට අනුමත තනතුරුවල පුරප්පාඩු 111 ක් පැවතුනි.

(ඇ) 2006 අගෝස්තු 01 දිනැති අංක 28 (II) දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සහ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ 1.2 ඡේදයේ දක්වා ඇති විධිවිධාන අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව තනතුරු ඇතිකිරීම හා පුරප්පාඩු පිරවීම සිදු නොකළ යුතුය. එසේ වුවත්, කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 168 ක් හා අනියම් සේවකයින් 61 ක් එම තනතුරු සඳහා බඳවාගෙන තිබුණි.

(ඈ) කළමනාකරණ හා පහල මට්ටමේ තනතුරු සඳහා පමණක් උසස්වීම් හා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර තිබුණි. තවද, 2012 මැයි 17 දිනැති අංක ඩීඑම්එස්/ඊ3/43/4/268/I දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රධාන අභ්‍යන්තර විගණක හැර MM 1-2 කාණ්ඩයේ තනතුරු HM 1-2 කාණ්ඩයේ තනතුරුවලට උසස් කර තිබුණු අතර අභ්‍යන්තර විගණක තනතුර හැර JM 1-1 කාණ්ඩයේ තනතුරු MM 1-2 කාණ්ඩයේ තනතුරුවලට උසස් කර තිබුණි. මේ සඳහා හේතු විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ඉ) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සඳහා සේවකයින් පස් දෙනෙකු මුදා හැර තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව එම සේවකයින්ගේ වැටුප අදාල ආයතන විසින් ප්‍රතිපූර්ණය කළ යුතුය. කෙසේ වුවත්, 2017 වර්ෂය සඳහා එම සේවකයින්ට ගෙවන ලද රු.2,061,545 ක වැටුප් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

## 5 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 12 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඩී/01/04/2014/01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනුව, 2017 – 2021 වර්ෂයන් ආවරණය වන කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාව විසින් ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබූ නමුත් එම ක්‍රියාකාරි සැලැස්ම තුළ පහත දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

- (i) මානව සම්පත් සංවර්ධන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත්ව නොතිබුණි.
- (ii) වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල යෝජිත ප්‍රධාන ආයෝජනයන් ධාරිතා වර්ධනයන් හා ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුලත් නොවුනි.
- (iii) ණය ආපසු ගෙවීමේ සැලැස්ම ඇතුලත් කර නොතිබුණි.
- (iv) මූල්‍ය වර්ෂය සඳහා ක්‍රියාත්මක කළ යුතු වාණිජමය කාර්යයන් ඇතුළත් කිරීමෙන් තොරව එක් එක් අංශය සඳහා මූල්‍ය ඉලක්කයන් පමනක් සඳහන් කර තිබුණි.
- (v) ඉලක්කයන් ඉටු කර ගැනීම සඳහා සම්පත් අවශ්‍යතාවය දක්වා නොතිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තත්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

## 6 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීමට අපොහොසත් වීම. |
| | (ii) ගෙවිය යුතු බදු හා ඊට අදාල අධිභාර ගිණුම්ගත කර නොතිබුණි. |
| | (iii) පාලන ගිණුම් සැසදීමට හා මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කිරීමට අසමත් විම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් මත පාලනය | (i) | දුර්වල ණයගැති පාලනය. |
| | | (ii) | රජයේ ණය ක්‍රමයෙන් ඉහල යාම. |
| | | (iii) | දිගුකාලීනව හිඟහිටි ණයගැතියන් පැවතීම. |
| | | (iv) | සේවාදායකයන් වෙත ඉන්වොයිස් කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාදයන් තිබීම. |
| | | (v) | දිගුකාලීනව හිඟහිටි මිලදී ගැනීම් හා සවලීකරන අත්තිකාරම්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් හා බදු හා ඊට අදාල අධිහාර පැවතීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | (i) | මානව සම්පත් වෙනත් ආයතන වෙත මුදාහැරීම. |
| | | (ii) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවා ගැනීම. |
| | | (iii) | ජොෂ්ඨ කළමනාකරණය සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම. |
| (ඈ) | වත්කම් කළමනාකරණය | (i) | 2014 වර්ෂයේ සිට පොලොන්නරුවේ ඇස්පලට් යන්ත්‍රය නිෂ්කාර්ය වීම. |
| | | (ii) | සියළුම ඉඩම්වල අයිතිය වර්ෂය අවසාන වන විට අත්කර ගැනීමට නොහැකි වීම. |
| (ඉ) | මූල්‍ය කළමනාකරණය | | දුර්වල කාරක ප්‍රාග්ධන කළමනාකරණය නිසා අනුමත සීමාවන් ඉක්මවා කෙටිකාලීන මූල්‍ය ගැටළු සඳහා පිළියම් ලෙස බැංකු අයිරා ලබා ගැනීම. |
| (ඊ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම ප්‍රමාද වීම හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම නොමැති වීම. |
| (උ) | තොග පාලනය | (i) | තොග අයිතම සඳහා බින් කාඩ් නඩත්තු නොකිරීම. |
| | | (ii) | එක් එක් හා සෑම වැඩබිම්වල භෞතික තොග ශේෂ හා තොග ලෙජර් ශේෂ අතර වූ වෙනස්කම් සැසඳීම් සිදු නොවීම. |
| | | (iii) | විශේෂයෙන් යන්ත්‍රෝපකරන හා වාහන අමතරකොටස් සඳහා උචිත මිල කැදවීමේ ක්‍රමයක් හඳුන්වා දීමට අසමත් වීම. |